

ශ්‍රීලංකාවේ යුද අපරාධ ගැන සොයන්නට බැන්කි මූන් පත්කළ විශේෂ කමිටුවේ තිදෙනා

To investigate and report on Sri Lanka's alleged war crimes, UN General Secretary Ban Ki Moon on his own accord appointed a 3-member panel. Here they are : (from left) Yasmin Sooka (from South Africa), Marzuki Darusman (former Attorney General in Indonesia ), Ban Ki Moon, and Steven Ratner (An American lawyer)

1 වන පිටුවෙන්

# සිදුවීම් රැසක් තුළ අපේ නොදැක්ම

## පුද්ගලික අංශයට විශ්‍රාම වැටුප් දෙන්නට ගොස් ඉන් ඇති වූ අවුල

ශ්‍රීලංකාවේ පාලක පක්ෂයට මේ නොබෝදා මුහුණ දෙන්නට සිදුවූ අවුල් සහගත තත්වයක් නම් පුද්ගලික අංශයේ රැකියාවන්හි නියුතු සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇතිකරන්නට රජය ගත් උත්සාහය ආරම්භයේදීම කලබලකාරී තත්වයක් ඇතිවීම නිසා නවතා දමන්නට සිදුවීමයි. රටේ සියළුම රජයේ සේවකයන් විශ්‍රාම වැටුපකට හිමිකරුවන්වීම බ්‍රිතාන්‍යය ශ්‍රීලංකාවේ රජයේ සේවය ඇරඹූ දා සිට අද දක්වා පවතින්නකි. එහෙත් 1960 ගණන් වනතුරු ලංකාවේ පුද්ගලික අංශයේ සේවකයන් රැකියාවෙන් ඉවත්ව ගියේ කිසිදු දීමනාවක් නැතිව හිස් අතිනි. ඒ කොම්පැනි අයිතිකාර හාම්පුතුන්ගේ හොඳ හිත අනුව සමහර විට අස්වී යන සේවකයෙකුට බෝනස් හෙවත් විශේෂ දීමනාවක් ලැබුණි. එහෙත් එය හැම තැනම නොවීය. ශ්‍රීලංකාවේ කම්කරු සංවිධාන සහ වෘත්තීය සමිති ව්‍යාපාරය පුද්ගලික සේවකයන් සඳහා කුමන හෝ දීමනාවක් ලැබිය යුතුයයි කලක් තිස්සේ උද්ඝෝෂණය නැගුවත් එවැන්නක් ක්‍රියාත්මක වූයේ නැත.

පුද්ගලික අංශයේ සේවකයන්ට අර්ථ සාධක අරමුදලක් Emplyers Provident Fund) ප්‍රථම වරට ආරම්භකරන ලද්දේ 1960 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය බලයට ආ ශ්‍රීලනිප රජයේ කම්කරු ඇමති ධූරය ඉසිලූ ටී. බී. ඉලංගරත්න මහතා විසිනි. ඉලංගරත්න මහතා වෘත්තීය සමිතිකරණයේ පළපුරුද්දක් ඇති, එමෙන්ම සේවකයින්ගේ අර්ථසාධනය පිළිබඳ දැඩි උනන්දුවක් දැක්වූ දේශපාලනඥයෙකු වීය. අදත් අප රටේ ඉලංගරත්න මහතාට ප්‍රශංසා කරන්නේ එතුමා එදා ගත් මහඟු පියවර නිසාය. අර්ථ සාධක අරමුදල් ක්‍රමය නිසා පුද්ගලික අංශයේ සේවයෙන් ඉවත්ව ගිය දාක සේවකයාට එහි සැළකිය යුතු මුදලක් තැන්පත්ව ඇති අතර, ඔහු කැමති විටක එය ගතහැකි වන්නේය. අවශ්‍ය දෙයකට ආයෝජනය කළහැකි වන්නේ ය. එසේම පුද්ගලික සේවක පක්ෂය අනාගතය පිළිබඳ ඉමහත් බලාපොරොත්තු තබාගෙන ඉන්නේ එම අර්ථසාධක මුදල පසුබිම් කරගෙන ය.

ප්‍රොවිඩන්ට් ෆන්ඩ් හෙවත් සේවක අර්ථසාධක අරමුදල යනු සේවකයාගේ සේවිකාවගේ දහඩිය මහන්සියේ වටිනාකමට ලැබෙන ඔහුගේ හෝ ඇයගේ එකම සම්පත වැනි මුදලය. එම මුදලට සේවකයාගේ කැමැත්තක් නැතිව කිසිවෙකු අත ගසන්නට යන්නේ නම් එය භයානක විපත් දෙන කටයුත්තක් බව සිතිය යුතුය.

***Provident Fund* හෙවත් සේවක අර්ථසාධක අරමුදල යනු සේවකයාගේ සේවිකාවගේ දහඩිය මහන්සියේ වටිනාකමට ලැබෙන ඔහුගේ හෝ ඇයගේ එකම සම්පත වැනි මුදලය. එම මුදලට එකී සේවකයාගේ කැමැත්තක් නැතිව කිසිවෙකු තම හිතු මනාපයට අතගසන්නට යන්නේ නම් එය භයානක විපත් දෙන කටයුත්තක් බව සිතිය යුතුය.**

## සරසවි ඇදුරු වැඩ වැරුම සහ එයට සම්බන්ධිත දෑ

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය Federation of University Teachers (FUTA) පඩිවැඩි කිරීමක් ඉල්ලා වැඩවර්ජනයක යෙදී මාසයකටද වැඩිය. ඔවුන් දිනපතා කරන්නට කැපවී සිටින ඉගැන්වීම් කටයුතු පමණක් කරන අතර ස්වේච්ඡාවෙන් යෙදුණු රාජකාරි කිරීම අත්හැර ඇත. එම අත්හරින ලද කටයුතු අතර, අංශ ප්‍රධානීන් වශයෙන් කටයුතුකිරීම, සිසුන් සඳහා විභාග පැවැත්වීම, විනය පාලනය ආදී විශ්වවිද්‍යාලයක් ඉතා පහසුවෙන් ක්‍රියාත්මක වීමට අදාල වූ බොහෝ වැදගත් කටයුතු සියල්ලද අයත්වන්නේය. උසස් අධ්‍යාපන අමාත්‍යංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම ආදී ආයතන කිසිවක් හෝ මේ අවුල සමථයකට පත්කිරීමට මෙතෙක් වෙහෙසක් ගෙන නොමැත.

මෙතන නෙමේරූ ලාබාල උපාධි අපේක්ෂකයින් නැත. එසේත් නැතිනම් ජනතා විමුක්ති පෙරමුණ හෝ වෙනත් වාමාංශික දේශපාලන පක්ෂයක කියුම් බස් පිට, පවතින රජයක් අපකීර්තියට හා පීඩාවට පත්කරන්නට සිතා වැඩ වර්ජනය කළ පිරිසක් ද නොවේ. එසේත් නැත්නම් කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් මෙන් පිටතින් පැමිණ බලපෑම් කළ පුද්ගලයන්ගේ බහට නැමී, රාජ්‍ය විරෝධී කණ්ඩායමක අතකොළු බවට පත්වී වැඩ වර්ජනයක යෙදුණු පිරිසක් ද නොවේ. මෙතැන වැඩ වරා සිටින්නේ ඉතා වටිනා, නුවණින්, බුද්ධියෙන් වැඩුණු සේවකයන් පිරිසකි.

මේ අය අප විශ්වවිද්‍යාල වල උපාධි පාඨමාලා හැදෑරීමෙන් නිෂ්පාදනය වුණු හොඳම කොටසයි. විශ්වවිද්‍යාලයන්හි ඒ අදාළ විෂයයන් ඉගැන්වීමට ඔවුන් යොදාගෙන ඇත්තේ ඒ නිසාය. බාහිර ඒ සඳහා සුදුසු වෙනත් අය නැත. තමා ලබා ඇති සුදුසුකම් සමග මේ අයට රජයේ හෝ සංස්ථාවල හෝ වෙනත් පුද්ගලික ආයතන වල හෝ පරිපාලන, උපදේශක, බැංකු කළමනාකරණය හෝ ආදායම්බදු ගණනය ආදී විවිධ රැකියා සඳහා යන්නට ඕනෑතරම් අවකාශ තිබුණේය. එහෙත් ඔවුන් එසේ නොගොස් විශ්වවිද්‍යාලවලම සේවය කරන්නට, තමා උගත් විෂය පථයන් ඔස්සේ නිදහසේ උගන්වන්නට, පර්යේෂණ කරන්නට ඉටාගෙන නැවතුණු පිරිසකි. නවීන විද්‍යාවේදී මෙම නිදහස යනු සොබා දහමෙන් ප්‍රශ්න නැගීමය. සමාජ විද්‍යාවේදී නම් සමාජයේ යම් කායියන් හා අවස්ථාවන් පිළිබඳ ප්‍රශ්න නැගීමය. දැනුම ඉදිරියට යන්නේ ඒ මගිනි. මෙම ප්‍රශ්න මතුකිරීමේ නිදහස ශාස්ත්‍රීය නිදහස වශයෙන්ද සැලකේ. මේ අය මෙසේ නොවිය යුතුය මෙසේ විය යුතුය යනුවෙන් අණ දෙන්නට හසුරුවන්නට ඔවුන් පසුපස ලොක්කෙක් නැත.

මෙම පිරිසේ සියළු දෙනාම පාහේ විදේශයේ ඉහළින් පිළිගත් විශ්වවිද්‍යාල විද්‍යාපීඨ විද්‍යායාතනයන්හි වසර ගණනාවක් පර්යේෂණ කාර්යයන්හි නිරතවෙමින් එකී විෂයයන්හි පුහුණුව හා සුදුසුකම් තුළින් පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා ලබාගත් අයයි. ඔවුන්ගේ උගත්කම් සහ කාර්යක්ෂමතාව මත බොහෝ දෙනෙකුට ඒ රටවල විද්‍යාපීඨයන්හි ඉහළ වැටුපකට තනතුරු ලැබ සේවයකරන්නට ද ඒ රටවල ජීවත්වීමේ පහසුකම් ද ලැබුණි. එසේ නැවතුණු සමහර අය අනන්තවත් සිටිති. එහෙත් බහුතරයක් එබඳු පහසුකම් සහ පිටරට වාසය ප්‍රතික්ෂෙප කොට පෙරළා තම උපන් රටට ආහ. තම උපන්බිමට සේවය කරන්නට එහි අනාගත පරපුරේ දැස් පාදා ඔවුන් ද උගතුන් කරන්නට මෙම පුද්ගලයින් තුළ වැඩුණු කැමැත්ත ඊට මූලික හේතුව වීය. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ප්‍රශ්න ගැන සිතා බලද්දී මූලික වශයෙන් සැලකිල්ලට ගතයුතු කාරණය එයයි. රටේ සංවර්ධනයට දීප්තියට ඔවුන්ගෙන් ලැබෙන කැපවීම දායකත්වය රුපියල් වලින් ඩොලර් වලින් පවුම් වලින් මනින්නට හැකි දෙයක් නොවේ. අප රටේ පාලකයින් මේ කාරණය අමතක කර ඇති බව පෙනෙන්නට ඇත.

## විශ්වවිද්‍යාලවල පඩි නඩ්

1970 දී උපාධිය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රථම පන්තියේ හෝ ද්වීතිය විශේෂ උපාධියක් හෝ ලැබ සේවයට ආ සහකාර කථිකාචාර්යවරයෙකුට මාසිකව රුපියල් 700 ක පඩියක් ලැබුණි. එකල පුද්ගලික අංශයේ පරිපාලන ක්ෂෙත්‍රයේ හෝ බැංකුවල ඒ තනතුරකට ලැබුණේද රුපියල් 500-600 අතර පඩියකි. එදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පඩියද රුපියල් 600 කි. 1970 කාලයේ මේ මුදල් ප්‍රමාණය ලොකු ගණනකි.

නමුත් අද මේ 2011 තත්වය දෙස බලන්න. විශ්වවිද්‍යාල සහකාර කථිකාචාර්යවරයෙකුට රුපියල් 29,000ක් පඩිය වශයෙන් ලැබෙන අතර, පුද්ගලික අංශයේ කළමනාකාර පුහුණුකරුවෙකු රුපියල් 63,000 ක් ගෙවා බඳවාගනී. මූල්‍ය පරිපාලන හා වෙනත් අංශයන්හිද වේතන පරිමාණයන් ඊට සමානය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට පවා අද පටන් ගන්නේ රු 54,600 ක වේතනයකිනි.

මෙම සහකාර කථිකාචාර්යවරු ආචාර්ය උපාධිය ලැබ ආ පසුව ඔවුන්ට ආරම්භයේ ලැබෙන්නේ රු 37,650 කි. වසර පහකට පසු 1 වන ශ්‍රේණියට උසස් වූ විට ඒ ගණන රු 42,650 දක්වා ඉහළ යයි. මහාචාර්යවරයෙකුගේ ආරම්භක වේතනය 45,850 ක් වන අතර, වසර පහකට පසු ඔහු රු 50,905 ක් ලබනවා ඇත. වසර ගණනාවක් සිසුන් දහස් ගණනකට උගන්වමින් හා පර්යේෂණ කටයුතු කරමින් සිට වයස 65 වන විට නැමුණු හා කුදුවුණු කොන්දක්ද ඇතිව ඒ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා රුපියල් 57,755 ක් පමණක් ලබමින් විශ්‍රාම යයි.

මෙසේ වසර බොහෝ ගණනාවක් ඉතා ඉවසීමෙන් යුතුව බලා සිටි මේ සරසවි ඇදුරුපෙළ අද ඉතා සාධාරණ වූත් යුතුකම් වශයෙන් වුවද ලැබිය යුතු වූත් වේතනයක් ඉල්ලා සිටිති. ඔවුන් හඳ ඉල්ලා සටන් වැද සිටිනවා නොවේ. මේ මිනිස්සුම බලවේගයක් ලෙස සැදී මේ රජයද, ජනාධිපතිවරයා ද ජයග්‍රහණය කරවන්නට කැපවී කටයුතු කළ පිරිස් වෙති. නමුත් අද ඔවුන් මේ රජයේ උසස් අධ්‍යාපනය පිළිබඳ ඇමතිවරයාගෙන් හා ඔහුගේ සහචරයන්ගෙන් පවා ලබන්නේ උපහාසාත්මක වචනය, බැණුම්ය, නිර්දය විවේචන හා සමච්චල්ය.

ඉහළ තැන්වල සිටින අය රට සංවර්ධනය කිරීම ගැන විවිධ කතාවන් වේදිකාවල ද ජනහමුවන්හිදී ද කියනු අපි අසා ඇත්තෙමු. ශ්‍රීලංකාව මුළු ආසියාවේම ආශ්චර්යය ද දැනුම ඥාණය පිළිබඳ මධ්‍යස්ථානය බවට ද හරවන බව නිතර කියති. එය අසා මිනිස්සු අත්පොලසන් දෙති. එසේ කරන්නට යන්නේ මේ විදියට දැයි ඔවුන්ගෙන් අප ඇසිය යුතුව ඇත.

# අවුල් පිට අවුල්වල ඇතුල් පැත්ත

ලංකාවිත්ති මැයි මස කලාපයේ පළවූ අන්තො ජටා බහි ජටා හෙවත් ඇතුළත අවුල් හා පිටත අවුල් ලිපියට පාඨක බොහෝ දෙනෙකුගේ අවධානය යොමුවූ බව පෙනේ. ඇතුළත හා පිටත අවුල් ගැන අද දවසේ තවත් බොහෝ දේවල් ශ්‍රී ලංකාවෙන් පමණක් නොව බාහිර ලෝකයේ ද තවත් දැකිය හැකිය. ඒවා විසඳිය යුත්තේ කවුරුද? විසඳිය හැක්කේ කාටද? කවදාද? කොහොමද? යන්නට පිළිතුරක් තවම ලැබී නැත. ලැබෙන බවක් ද නොපෙනේ.

මීට මාස තුනකට පමණ ජපානයේ සිදු වූ භූමිකම්පාවෙන් සෙසු ලෝකයා ද තැතිගැනුණේ විශේෂ හේතුවක් නිසාය. ආපදාවට ලක්වූ න්‍යෂ්ටික බලාගාරවලින් පිටවුණු විකිරණශීලී වායූන් ගුවන සිසාරා පැමිණ වෙනත් රටවල ජීවිත ද අණතුරට පත්වෙතැයි ප්‍රචලිතවුණු නිසා ය. එය එසේ විය හැකි බවට විශේෂඥයින් ද, විද්‍යාඥයින් ද, දේශපාලකයින් ද, ජපන් රජය ද, එක්සත් ජාතීන්ගේ සංවිධානය ද පුන පුනා කීවත් අද වන විට සිදුවූ ප්‍රථිඵල ගැන කිසිවෙක් කිසිවක් නොපවසති. ඒ සිද්ධිය නිමාවුණා සේ දැන් කාටත් අමතක ය. අවුල ඇත්තේ මේවා ප්‍රසිද්ධ කොට, බිය ඇතිකොට, තොරතුරු වසන්කිරීම ය.

ලිබියාවේ ගඩාෆි පාලනය පෙරළා දැමීමට, ඔහුව කුදලාගැනීමට තරම් රටවල් ගණනාවක්ම එක්ව නීත්‍යානුකූල භාවයකින් යුතුව සටනක් ඇරඹීය. මුලු ලොව පමණක් නොව එක්සත් ජාතීන්ගේ මහ බලවතුන් පස් දෙනාද දෙකට බෙදිණ. තෙල් මිළ, ලෝක ආර්ථිකය, ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම, තානාපති සබඳතා ආදිය සසල විය. අද වන විට නටපු තොයිලයකුත්, බෙරේ පලුවකුත් නැතුවා සේ ය. අහිංසක මිනිස්සු මිය පර ලොව ගියෝය. ගඩාෆි තවමත් ලිබියාව පාලනය කරයි. බලවත් රාජ්‍යවල යුද හවුල් අවි සෙල්ලමේ යෙදී සිටිති. ඉතින් මෙම අවුල් නිරවුල් වෙන්නේ කවදාද?



ලිබියානු නායක මුවිහම්මර් ගඩාෆි

බහරේනය, සිරියාව, ලෙබනනය, ඊජිප්තුව, තුනීසියාව ආදී රටවල අවුල් ඇත්තේ ඇයි? ඒවා නිරවුල් විය යුත්තේ කෙසේද? මෙම අවුල් වලට මූලික වන මහජන සංවිධාන වලට විරෝධය පාන බොහෝ බලවතුන් අවුලක් නැතිවම තමනට යුදඅවි විකුණන සමාගම් වලට කිසිදු විරෝධයක් නොපෑමද ප්‍රශ්නයකි. යුදඅවි නිපදවීම, විකිණීම හා පරිහරණය පාලනය වන්නේ නම් ත්‍රස්තවාදය වැලැක්වීමේ පළමු පියවර ද එතැනය. එහෙත් එය කිසිදා සිදු නොවන්නකි.

ශ්‍රීලංකාවේ අවුල්, තව තවත් අවුල් වන බව පෙනේ. අළුත්ම අවුල පුද්ගලික අංශයේ සේවකයන්ට විශ්‍රාම වැටුප් දීමේ යෝජනාවයි. පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුප් ඉල්ලා මින් පෙර කිසිවෙකු උද්ඝෝෂණ පෙළපාලි දක්වා නැත. එහෙත් වත්මන් රජය යහපත් චේතනාවකින් යුතුව විශ්‍රාම වැටුප් යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. එය ඉදිරිපත් කළේද ඉතා හදිසි ජාතිකමය වැදගත් යෝජනාවක් ලෙසිනි. එහෙත් මෙහිදී විරුද්ධ පක්ෂය චිරාගතවම විරුද්ධ විය. වෘත්තීය සමිති විරුද්ධ විය. කම්කරු පන්තිය සාමුහිකව විරුද්ධ විය. රජයට හිතවත් වෘත්තීය සමිතිද විරුද්ධ විය. රජයත්, දේශපාලන නායකයිනුත්, නිලධාරීනුත්, විද්වතුනුත් කියා සිටියේ මෙය යහපත් පනතක් බවය. එසේ නම් එම යහපත් පැත්ත කම්කරු ජනතාවට තේරුම්කර දෙන්නට නොහැකි වුණේ අවුලක් නිසා බව පෙනේ.

මෙවැනි අවුල් විසඳාගත හැකි හොඳම යාන්ත්‍රණය පාර්ලිමේන්තුවයි. වසර 80 ක පාර්ලිමේන්තු ඉතිහාසයක් හා පළපුරුද්දක් අපට ඇත. එය ප්‍රයෝජනයට නොගැන්ම ද අවුලක් නොවේද? අවසානයේදී විශ්‍රාම වැටුප් යෝජනාව ඉල්ලා අස්කරගෙන ඇත. මේ වන විට කම්කරු නොසන්සුන්තාව තව තවත් තීව්‍රවී ඇත්තේ පොලිස් වෙඩිතැබීමක් නිසා උද්ඝෝෂණයට සහභාගිවූ නිදහස් වෙළඳකලාපයේ තරුණ සේවකයෙකුගේ මරණය සිදුවීම නිසා ය.

ශ්‍රීලංකාවේ පැවති මහජන උද්ඝෝෂණ පෙළපාලි වලදී මෙයට ඉහත ද මියගිය සැහෙන පිරිසක් සිටිති. 1947 මුල් කාලයේදී මියගිය කන්දසාමි, 1957 හර්තාලයේදී මියගිය අය, මැයි පෙළපාලියකදී මියගිය සෝමපාල, 1966 පැවති

5 වෙනි පිටුවට →